මෙම නියම හා කොන්දේසි ("නියම හා කොන්දේසි") **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය ("බැංකුව")** විසින් සපයනු ලබන (මෙහි මින්මතු " Neos BIZ" යනුවෙන් සඳහන් කරනු ලබන) ජංගම බැංකු සේවාවන් හරහා සිදු කරනු ලබන එක් එක් සහ සෑම ගනුදෙනුවක් සඳහා ම අදාළ විය යුතු ය.

බැංකුව විසින් Neos BIZ හරහා ගනුදෙනු කිරීමට පහසුකම් සලසා දීම සැලකිල්ලට ගෙන, මෙම නියම හා කොන්දේසි මගින් බැඳී සිටීමට මා/අප විසින් එකඟව සිටිනු ලැබේ.

1. අර්ථනිරූපණ:

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නාවූ තාක්දුරට හැර, මෙම නියම හා කොන්දේසි වල;

"බැංකුව" යන්නෙන්, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වේ.

"නම් කළ විද්‍යුත් තැපැල" යන්නෙන්, (අදාළ වන පරිදි) අයදුම්පත්‍රයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ දක්වා ඇති ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය අදහස් වේ. (මෙය බැංකුවේ පද්ධතියේ පවතින ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය හා සමාන විය යුතුය)

"ගිණුම්" යන්නෙන්, මෙම නියම හා කොන්දේසි අදාළ විය යුතු, මෙම අයදුම්පත්‍රයේ ලැයිස්තුගත කර ඇති හෝ බැංකුව සහ ගනුදෙනුකරු අතර ලිඛිතව අන්‍යාකාරයකින් එකඟ වූ ගිණුම් අදහස් වේ;

"නිවේදනය" යන්නෙන්, බැංකුව විසින් කලින් කලට නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හෝ ආකෘතියකින් ජංගම බැංකු සේවා යෙදුම හරහා හෝ අන්‍යාකාරයකින්, බැංකුව විසින් ගනුදෙනුකරු හෝ යම් බලයලත් පරිශීලකයකු වෙත ලබා දෙන Neos BIZ සම්බන්ධයෙන් වන යම් නිවේදනයක්, තහවුරු කිරීමක්, උපදෙසක් හෝ වෙනත් සම්ප්‍රේෂණයක් අදහස් වේ.

"අයදුම්පත්‍රය" යන්නෙන්, ගනුදෙනුකරු විසින් එකඟ විය යුතු මෙම නියම

හා කොන්දේසි සහිත වන Neos BIZ ජංගම බැංකු සේවා යෙදුම සඳහා වූ ආකෘති පත්‍රය අදහස් වේ.

"බලයලත් පරිශීලකයා/පරිශීලකයන්" යන්නෙන්, ගනුදෙනුකරුවකු විසින් ඔහු/ඇය/ඔවුන්/එය වෙනුවෙන් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශවීමට සහ එය භාවිත කිරීමට බලය ලබා දී ඇති පුද්ගලයන් අදහස් වේ.

"ජීව දත්ත" යන්නන්, බලයලත් පරිශීලකයා විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත පිවිසෙන අවස්ථාවේ දී ඔහුගේ/ඇයගේ තේරීම අනුව ඒ සඳහා භාවිත කළ හැකි මුහුණු අනන්‍යතාවය හෝ ඇඟිලි සලකුණු අනන්‍යතාවය අදහස් වේ.

"ජීව දත්ත මගින් ප්‍රවේශවීම" යන්නෙන්, යම් බලයලත් පරිශීලකයකු විසින් බැංකුවේ ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශවීමේ දී එම පරිශීලකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා බැංකුවේ ජංගම බැංකු සේවා මුරපදය වෙනුවට ආරක්ෂණ කේතයක් වශයෙන් නම් කළ උපකරණයක ලියාපදිංචි කර ඇති ඔහුගේ/ඇයගේ මුහුණ හඳුනාගැනීම හෝ ඇඟිලි සලකුණ භාවිත කළ හැකි වන සේවාවක් අදහස් වේ.

"අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය" යන්නෙන්, බැංකුව වෙතින් Neos BIZ සේවාවන් ලබාගැනීමේ කාර්ය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය/(අදාළ වන පරිදි) ගනුදෙනුකරුගේ සාමාජිකයන් විසින් යථා පරිදි සම්මත කරනු ලබන යෝජනා සම්මතය/යෝජනා සම්මතයන් අදහස් වේ.

"ගනුදෙනුකරු" යන්නෙන්, බැංකුව විසින් සපයනු ලබන Neos BIZ සේවාවන් භාවිත කරන බැංකුවේ ගනුදෙනුකරුවන් අදහස් වන අතර මෙම නියම හා කොන්දේසිවල කාර්ය සඳහා අදාළ වන පරිදි, ගනුදෙනුකරු විසින් පත් කරනු ලබන බලයලත් පරිශීලකයකු/පරිශීලකයන් ඊට ඇතුළත් වනු ඇත.

"නම් කළ උපකරණ" යන්නෙන්, බලයලත් පරිශීලකයා විසින් Neos BIZ කටයුතු සඳහා ලියාපදිංචි වී ඒවායෙහි නිරතවීමට භාවිත කරන්නා

වූ ඊට ගැලපෙන ජංගම උපාංග සහ ආශ්‍රිත උපකරණ අදහස් වේ.

"උපදෙස්" යන්නෙන්, යම් ගිණුමක් හෝ ගිණුම් සම්බන්ධයෙන්, යම් බලයලත් පරිශීලකයකු විසින්, මෙම නියම සහ කොන්දේසිවලට අනුකූලව සහ කලින් කලට බැංකුව සහ ගනුදෙනුකරු විසින් එකඟ වන්නා වූ යම් ආකාරයකින් හෝ ආකෘතියකින් ජංගම බැංකු සේවා යෙදුම හරහා හෝ අන්‍යාකාරයකින් බැංකුව වෙත ලබාදෙන යම් උපදෙස්, දත්ත හෝ වෙනත් සම්ප්‍රේෂණ අදහස් වේ.

"ප්‍රාථමික ගිණුම" යන්නෙන්, ගනුදෙනුකරු විසින් නම් කර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන බැංකුවේ පවත්වාගෙන යන්නා වූ යම් නිශ්චිත ගිණුමක් අදහස් වේ.

"බුද්ධිමය දේපළ අයිතිය" යන්නෙන්, යම් ප්‍රකාශන අයිතියක්, පේටන්ට් බලපත්‍රයක්, (ලියාපදිංචි කළ හෝ නොකළ) වෙළඳ ලකුණක්, සේවා ලකුණක්, වෙළඳ හෝ ව්‍යාපාර නාමයක්, දත්ත සමුදා අයිතියක්, (ලියාපදිංචි කළ හෝ නොකළ) සැලසුම් නිර්මාණ අයිතියක්, පරිගණක මෘදුකාංග භාවිත කිරීමේ අයිතිය, භූ ලක්ෂණ අයිතිය, වෙළඳ රහස් සහ ලොව ඕනෑම ස්ථානයක පවතින ඒ හා සමාන වෙනත් සියලු අයිතීන් අදහස් වේ.

"ජංගම බැංකු සේවා යෙදුම/ Neos BIZ" යන්නෙන්, ජංගම උපාංගයක් මගින් ගනුදෙනු සිදු කිරීමේ කාර්ය සඳහා බැංකුව විසින් ලබා දී ඇති යෙදුමක් අදහස් වේ.

"ජංගම බැංකු සේවාව" යන්නෙන්, බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ජංගම උපාංගයක ස්ථාපනය කරනු ලබන ජංගම යෙදුමක් හරහා පරිශීලක නාමයක් සහ මුරපදයක් භාවිත කරමින් හෝ ජීව දත්ත භාවිත කරමින් බැංකු ගනුදෙනු සැබෑ බවට සහතික කිරීම සහ/හෝ බැංකු ගනුදෙනු සිදු කිරීම අදහස් වේ.

"NEOS Pay" යන්නෙන්, අයදුම්පත්‍රයේ දක්වා ඇති පරිදි, බලයලත් පරිශීලකයා/පරිශීලකයන් සඳහා ගනුදෙනුකරු විසින් කලින් නියම කරනු ලබන සීමාවන් ඇතුළත ඔවුන්ට ගනුදෙනු කිරීමට හැකි

වීමේ අවස්ථාවට යටත් ව, ගනුදෙනුකරුවන් විසින් බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ/එහි ගිණුම් හරහා වෙළෙන්දා වෙත ගෙවීම් සිදුකිරීම සඳහා ගනුදෙනුකරුවන්ට භාවිත කළ හැකි QR කේත පදනම් කරගත් ගෙවීම් ක්‍රමයක් අදහස් වේ.

"OTP" යන්නෙන්, බැංකුව විසින් උත්පාදනය කරනු ලබන එක් වරක් භාවිතා කළ හැකි මුරපදය අදහස් වේ.

"මුරපදය" යන්නෙන්, බැංකුව විසින් කෙටි පණිවුඩයක් හරහා එක් එක් බලයලත් පරිශීලකයාගේ (ගනුදෙනුකරු විසින් අයදුම්පත්‍රයේ නිශ්චිත දක්වා ඇති) ජංගම දුරකථන අංකය වෙත මුලින්ම යවනු ලබන මුරපදය හෝ බලයලත් පරිශීලකයා විසින් පසුව සකස් කරගනු ලබන මුරපදය අදහස් වේ.

"QR කේතය" යන්නෙන්, වෙළෙන්දන් විසින් සපයනු ලබන ක්ෂණික ප්‍රතිචාර කේතය අදහස් වේ.

"සේවා සැපයුම්කරු" යන්නෙන්, විදුලි සංදේශ සැපයුම්කරුවන්, රක්ෂණ සමාගම්, ජල සැපයුම් සමාගම සහ විදුලි සැපයුම් සමාගම්, වැනි යම් තුන්වන පාර්ශ්වයේ උපයෝගිතා සැපයුම්කරුවකු අදහස් වේ.

"වැඩ කරන දිනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු ගනුදෙනු කටයුතු සඳහා විවෘතව තබන දිනයක් අදහස් වේ.

"පරිශීලන අනන්‍යතාවය" (User ID) යන්නෙන්, සෑම බලයලත් පරිශීලකයකු සඳහා ම බැංකුව විසින් නිර්මාණය කරනු ලබන විශේෂ පරිශීලක හඳුනාගැනීම අදහස් වන අතර එය බැංකුව වෙත ලබා දී ඇති ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යවනු ලැබේ. (අදාළ පරිදි) එම පරිශීලක අනන්‍යතාව අදාළ බලයලත් පරිශීලකයා/පරිශීලකයන් වෙත දැනුම් දීම ගනුදෙනුකරුගේ වගකීම වන්නේ ය.

2. ජංගම බැංකු සේවා යෙදුම භාවිත කිරීමේ අයිතිය සහ බුද්ධිමය දේපළ අයිතීන්

2.1 බැංකුව විසින්, මෙම නියම හා කොන්දේසි වල නියමයන්ට අනුව ජංගම බැංකු සේවා යෙදුම භාවිත කිරීමේ අනන්‍ය නොවන අයිතියක් ගනුදෙනුකරු වෙත ලබා දෙනු ලැබේ.

2.2 ජංගම බැංකුසේවා යෙදුම හෝ ඒ ආශ්‍රිත ද්‍රව්‍යයක් සම්බන්ධව කිසිදු හිමිකමක් හෝ, අයිතිය පිළිබඳ අයිතිවාසිකමක් හෝ බුද්ධිමය දේපළ අයිතියක් ගනුදෙනුකරු වෙත ලබා නොදෙන අතර එවැනි හිමිකමක් හෝ අයිතියක් ගනුදෙනුකරු විසින් අත්කර ගනු නොලැබිය යුතු ය.

2.3 ගනුදෙනුකරු විසින්, තොරතුරු සංකේතනයට සහ විනිමය පාලනයන්ට අදාළව පවතින සීමාකිරීම්වලින් තොරව, ජංගම බැංකු සේවා යෙදුම සම්බන්ධයෙන් අදාළ වන සියලු නීති සහ විධාන යටතේ අවශ්‍ය කරනු ලබන යෝග්‍ය සියලු රාජ්‍ය, නියාමන සහ අදාළ වෙනත් බලපත්‍ර, අවරසරපත්‍ර සහ අනුමැතීන් ලබාගෙන පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

3. ගනුදෙනුකරුවන්/බලයලත් පරිශීලකයකු/පරිශීලකයන් ජංගම බැංකු සේවා යෙදුම වෙත ලියාපදිංචි කිරීම

3.1 ගනුදෙනුකරුවන්/සහ බලයලත් පරිශීලකයකු/පරිශීලකයන් ජංගම බැංකු සේවා යෙදුම වෙත ලියාපදිංචි කිරීම, බලයලත් පරිශීලකයන් සඳහා නියම කරනු ලැබිය යුතු ගනුදෙනු සීමාවන් සහ (අදාළ අවස්ථාවල දී) අනුරූප අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය ඇතුළුව ගනුදෙනුකරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විස්තර මත පදනම්ව බැංකුව විසින් සම්පූර්ණ කරනු ලැබේ.

3.2 Neos BIZ සඳහා ලියාපදිංචි වීම සහ Neos BIZ හරහා ගනුදෙනු සිදුකිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන්, බැංකුව වෙත නිරවද්‍ය සහ සම්පූර්ණ තොරතුරු සැපයීමට ගනුදෙනුකරු විසින් බාර ගත යුතු ය. යම් දෝෂයක් විෂමතාවක් හෝ මගහැරීමක් පිළිබඳ ගනුදෙනුකරුගේ සැලකිල්ලට ලක්වූයේ නම් ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

3.3 ගනුදෙනුකරුවන්/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් ජංගම බැංකු සේවා යෙදුම වෙත ලියාපදිංචි කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, බැංකුව විසින්, අදාළ බලයලත් පරිශීලකයා/පරිශීලයන් සඳහා පරිශීලක අනන්‍යතාවන් (user ID) නිර්මාණය කර එකී පරිශීලක අනන්‍යතාව (user ID) අයදුම්පත්‍රයේ සහ (අදාළ පරිදි) අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ දක්වා ඇති ගනුදෙනුකරුගේ නම් කළ විද්‍යුත් තැපැල්

ලිපිනය වෙත (මෙම විද්‍යුත් තැපැල් ලිපිනය බැංකුවේ ඒ වන විට පවතින ගනුදෙනුකරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය හා සමාන විය යුතු ය) යවනු ලබන විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් ගනුදෙනුකරු වෙත දැනුම් දෙනු ලැබේ. තවද, පරිශීලක අනන්‍යතාවය (user ID) අදාළ පරිදි අදාළ බලයලත් පරිශීලකයා/පරිශීලකයන් වෙත දැනුම් දීම ගනුදෙනුකරුගේ වගකීම වන්නේ ය.

3.4 ඉන්පසුව, බැංකුව විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති පරිශීලකයන්ගේ ජංගම දුරකථන අංකය/අංක වෙත යවනු ලබන කෙටි පණිවුඩයක් (sms) මගින් මුරපදය ඔවුන්ට දැනුම් දිය යුතු ය.

3.5 ඉහත කී පරිදි බැංකුව විසින් ලියාපදිංචිකිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව, බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින්, ඔහුගේ/ඇයගේ නම් කළ උපකරණය හරහා Neos BIZ යෙදුම බාගත කරගත යුතු අතර එය වෙත පළමුවර පිවිසීමේ දී ම බැංකුව වෙත ලියාපදිංචි කර ගනු ලැබේ. බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් Neos BIZ වෙත පළමුවර පිවිසීමේ දී ම (login) මෙම නියම හා කොන්දේසි වලට සිය කැමැත්ත ලබා දී ඒවා පිලිගනු ලැබිය යුතු අතර බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් එසේ සිදු කරනු ලබන පිළිගැනීම (සංශෝධිත පරිදි) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත (ETA) ප්‍රකාරව "ඉලෙක්ට්‍රොනික අත්සනක්" ලෙස සලකනු ලබන අතර එමගින් ETA හි 17 වන වගන්තිය සමග කියවිය යුතු 11 වන වගන්තිය ප්‍රකාරව බැංකුව සහ බලයලත් පරිශීලකයා/පරිශීලකයන් අතර වලංගු සහ බන්ධනීය ගිවිසුමක් සංස්ථාපනය වන්නේ ය.

3.6 අයදුම් කිරීමෙන් පසුව, බැංකුව විසින්, "Neos BIZ ජංගම බැංකු සේවා ගිණුම සහ පරිශීලකයන් එකතු කිරීමේ/ඉවත් කිරීමේ ආකෘති පත්‍රය" භාවිත කර ගනුදෙනුකරුගේ නමින් විවෘත කර ඇති යම් ගිණුමක්/ගිණුම් සම්බන්ධ කිරීම හෝ ඉවත් කිරීම සහ බලයලත් පරිශීලකයන් එකතු කිරීම හෝ ඉවත් කිරීම සිදු කළ යුතු ය. එවැනි එකතුකිරීම හෝ ඉවත් කිරීම් බැංකුවේ පවත්නා රීති සහ නියෝග අනුව සිදුකරනු ලබන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිට පිළිගනු ලබන්නේ ය.

3.7 සේවා නියුක්තියෙන් ඉවත් කිරීම ආදි හේතූන් මත යම් බලයලත් පරිශීලකයන් වහාම අත්හිටුවීමක් සිදු කරනු ලබන අවස්ථාවක, ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු අතර, එවිට, බැංකුව විසින්, ඉහත 3.6 වන වගන්තියේ දක්වා ඇති පරිදි ස්ථිර ලෙස අත්හිටුවන ලෙසට ගනුදෙනුකරු විසින් ඉල්ලීමක් කරනු ලබන තෙක් හඳුනාගත් බලයලත් පරිශීලකයන් තාවකාලික අත්හිටුවීමකට යටත් කරනු ලැබිය හැකි ය. තව ද, බලයලත් පරිශීලකයා/පරිශීලකයන් Neos BIZ

වෙත ප්‍රවේශවීම තාවකාලිකව අත්හිටුවන ලෙසට ගනුදෙනුකරුගෙන් බැංකුව වෙත සාධාරණ නිවේදනයක් ලැබීමෙන් පසුව සහ/හෝ එකී බලයලත් පරිශීලකයා/පරිශීලකයන් අත්හිටුවීමකින් තොරව අඛණ්ඩව තබා ගැනීම ගනුදෙනුකරුට අනාර්ථදායක විය හැකි බව විශ්වාස කිරීමට බැංකුවට සාධාරණ හේතු ඇති විට ඉහත සඳහන් කිසිවක් මගින් බැංකුව විසින් එසේ තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කිරීම වලක්වනු නොලැබේ. එසේ වුවද, කිසිදු හේතුවක් මත, එකී තාවකාලිකව අත්හිටුවීම බලාත්මක කිරීමේ දී ඇතිවන කිසිදු දෝෂයක් සඳහා බැංකුව වගකිව යුතු නොවන අතර ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් දරනු ලබන යම් පාඩු සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කළ යුතු ය.

4. ජංගම බැංකු සේවාව මගින් සිදු කරන ගනුදෙනු පිළිබඳ උපදෙස් සහ පණිවුඩ

4.1 ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීම (login), බලයලත් පරිශීලකයාට/පරිශීලකයන්ට ඔහුගේ/ඇයගේ අභිමතය පරිදි තීරණය කළ හැකි වන්නා වූ පරිදි, මුරපදය ඇතුළත් කිරීමෙන් හෝ ජෛවමිතික ක්‍රමයක් මගින් හෝ සිදු කිරීමට අවසර තිබේ.

4.2 Neos BIZ හරහා බලයලත් පරිශීලකයා/පරිශීලකයන් වෙතින් පැමිණෙනු ඇති බවට සැලකෙන සහ බැංකුව වෙත ලැබෙන සියලු උපදෙස් හෝ පණිවුඩ පිළිගැනීමට හෝ ඒ අනුව කටයුතු කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

4.3 ගනුදෙනුවක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් පිළිබඳ විස්තර යම් තුන්වන පාර්ශ්වයේ සේවා සැපයුම්කරුවකු සමඟ බෙදා ගැනීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

4.4 Neos BIZ හරහා හුවමාරු වන ඉලෙක්ට්‍රොනික පණිවුඩ ගනුදෙනුකරු සම්බන්ධයෙන් අවසානාත්මක සහ බන්ධනීය වන බවට ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

4.5 කවර ආකාරයකින් හෝ බලාත්මක කරනු ලබන Neos BIZ හරහා සිදුකරනු ලබන හෝ බලාත්මක කරනු ලබන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් පූර්ණ වගකීම ගනුදෙනුකරු විසින් භාරගනු ලැබිය යුතු ය.

4.6 Neos BIZ සඳහා ලියාපදිංචි වීමෙන් පසුව, ගනුදෙනුකරු විසින් පවත්වාගෙන යනු ලබන නම් කළ ගිණුම් ජංගම බැංකු සේවා යෙදුමට සම්බන්ධ වන බව ඔහු/ඇය/ඔවුන්/එය විසින් පිළිගනු ලැබේ.

4.7 බැංකුවේ පවත්වාගෙන යන්නා වූ ගනුදෙනුකරුගේ ගිණුම්වලින් එක් ගිණුමක් අයදුම්පත්‍රයේ විශේෂිතව සඳහන් කිරීම මගින් ඔහු/ඇය/ඔවුන්/එය විසින් එම ගිණුම ප්‍රාථමික ගිණුම ලෙස නම් කරනු ලැබිය යුතු ය.

4.8 පහත 8 වන වගන්තිය (ගාස්තු සහ ගෙවීම්) යටතේ දක්වා ඇති පරිදි ගනුදෙනුව හා සම්බන්ධ වෙනත් ගාස්තු ඇතුළුව ප්‍රමාණවත් මුදල් ගනුදෙනුකරුගේ නම් කළ ප්‍රාථමික ගිණුමේ හෝ වෙනත් යම් ගිණුමක (ගිණුම්වල) තිබේ නම් මිස, ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් Neos BIZ හරහා ගනුදෙනු සිදුකිරීමට උත්සාහ නොකළ යුතු ය. ගනුදෙනුකරුගේ යම් ගෙවීම් උපදෙස් බැංකුව වෙත ලැබෙන අවස්ථාවේ දී ඉහත 8 වන වගන්තිය යටතේ සඳහන් කළ වෙනත් ගාස්තු සමඟ එකී උපදෙස් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් මුදල් තිබේ නම් මිස එම උපදෙස් ක්‍රියාවට නැංවීමට බැංකුවට කිසිදු බැඳීමක් නොමැති බවට ද එවැනි අවස්ථාවක දී ගෙවීම සිදු නොකිරීම පිළිබඳව වන දැන්වීම බැංකුව විසින් ගනුදෙනුකරු වෙත ලබාදීමට අවශ්‍ය නොවන බවට ද ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

4.9 බැංකුවේ නිලධරයකු/නිලධරයන් විසින් බලය දීමක් සිදුකිරීමට අවශ්‍ය වන්නා වූ ගනුදෙනුකරුගේ ඉල්ලීම්/උපදෙස් වහාම හෝ ස්වයංක්‍රීයව බලාත්මක විය නොහැකි බවට ද ගනුදෙනුකරු වෙත දැන්වීමෙන් හෝ දැන්වීමකින් තොරව තම පරම අභිමතය මත එම උපදෙස් සඳහා අවසර ලබාදීම හෝ අවසර ලබානොදී සිටීම සඳහා වන අයිතිය බැංකුව විසින් රඳවාගන්නා බවට ද ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

4.10 ගනුදෙනුකරු වෙනුවට ගෙවීමක් සිදුකිරීමේ දී, බැංකුව, ගනුදෙනුකරුගේ නියෝජිතයකු වශයෙන් හෝ ගෙවීම ලබන්නා වූ තුන්වන පාර්ශ්වයේ නියෝජිතයකු වශයෙන් හෝ ක්‍රියා නොකරන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

4.11 කවර හෝ ක්‍රමයක් භාවිතයෙන්, Neos BIZ හරහා ගනුදෙනුකරු විසින් සිදු කරන ලද පරිශීලක ක්‍රියාකාරකම් සහ ගනුදෙනු පිළිබඳ සටහන් පවත්වාගෙන යාමට සහ යම් නිශ්චිත ගනුදෙනුවක්/ක්‍රියාකාරකමක් පරිශීලක අනන්‍යතාව (user ID) සහ මුරපදය භාවිතයෙන් සිදු කරන ලද බව තහවුරු කිරීමේ හෝ එය සත්‍ය බව සහතික කිරීමේ කාර්ය සඳහා එම වාර්තා භාවිත කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත

මෙයින් බලය පවරනු ලැබේ.

4.12 රතු නිවේදන ගෙවීම් පියවීම වැනි හදිසි ගෙවීම් පියවීම සඳහා Neos BIZ භාවිත කළ නොහැකි බවට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

4.13 සියලු කාර්ය සඳහා, Neos BIZ හරහා සිදුකරන ලද සියලු ගනුදෙනු පිළිබඳ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශ ගනුදෙනුකරු සම්බන්ධයෙන් අවසානාත්මක සහ බන්ධනීය වන බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය. එම වාර්තා සහ ප්‍රකාශ මුල් ලේඛන නොවීම, ලිඛිත නොවීම, ප්‍රවාදක වාර්තා සහ ප්‍රකාශ වීම සහ/හෝ ඒවා පරිගනකයකින්/ඉලෙක්ට්‍රොනිකව සකස් කරන ලද වාර්තා සහ ප්‍රකාශ වීම යන හේතු මත පමණක් ඒවා නඩු කටයුතුවලදී සාක්ෂි ලෙස පිළිගැනීමට විරෝධතාවක් නොදැක්වීමට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

4.14 (බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි) බැංකුවේ ගනුදෙනු සිදුකළ හැකි අවසාන වේලාවෙන් පසුව Neos BIZ හරහා හෝ වෙනත් යම් මාර්ගයකින් සිදු කරනු ලබන ගනුදෙනුවල වලංගු දිනය එදිනට පසුව එළඹෙන දිනය වන බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

5. NEOS Pay පහසුකම

5.1 NEOS Pay පහසුකම මගින් Neos BIZ හරහා සිදුකරනු ලබන ගනුදෙනු සඳහා බැංකුව වගකියනු නොලබන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

5.2 වෙළෙන්දන් විසින් සපයනු ලබන QR කේතය මගින් ලැබෙන තොරතුරුවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් බැංකුවට කිසිදු බැඳීමක් හෝ වගකීමක් නොමැති බවට ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව පිළිගනු ලැබේ.

5.3 NEOS Pay පහසුකමට අදාළ යම් පැමිණිලි පහත 16 වන වගන්තියේ විස්තරාත්මකව දක්වා ඇති පැමිණිලි කාර්ය පටිපාටියට අනුව හසුරුවනු ලැබිය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

6. ගනුදෙනුවල සුරක්ෂිතභාවය

6.1 ගනුදෙනුකරු විසින්, Neos BIZ භාවිතා කිරීම සඳහා අවශ්‍ය වන නම් කළ උපකරණය/උපකරණ Neos BIZ වෙත ඇතිවිය හැකි හානිකර තර්ජනවලට එරෙහි

ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සහිතව නිසි පරිදි ක්‍රියාකරන තත්ත්වයකින් සපයාගෙන පවත්වාගෙන යාමට (සහ අදාළ පරිදි සපයා ගනු ලැබීමට සහ පවත්වාගෙන යනු ලැබීමට සැලැස්වීමට) එකඟව සිටිනු ලබන අතර Neos BIZ වෙත ප්‍රවේශවීම සඳහා දෝෂ සහිත, අසම්පූර්ණ හෝ අනාරක්ෂිත උපාංග සහ/හෝ මෘදුකාංග භාවිත කිරීම හෝ Neos BIZ සේවාව බැංකුව වෙත හානිදායක වන යම් ආකාරයකින් භාවිත කිරිම නොකර සිටීමට ගනුදෙනුකරු විසින් භාරගෙන සිටිනු ලැබේ.

6.2 ජීව දත්ත මගින් හෝ පරිශීලක අනන්‍යතාවයක් සහ මුරපදයක් භාවිතය යන කවර ආකාරයෙන් හෝ ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ විය හැකි බව ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන ඊට එකඟව සිටිනු ලැබේ.

6.3 ජීව දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශවීමට හැකියාව ලබාදීමෙන්, එම උපාංගයේම ජීව දත්ත ලියාපදිංචි කර ඇති යම් තුන්වන පාර්ශ්වයකට ද ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබාදෙන බවට ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව, ඒ බව අවබෝධ කරගෙන සිටිනු ලැබේ.

6.4 ජංගම බැංකු සේවා යෙදුම වෙත පළමුවරට ප්‍රවේශ වීමෙන් ඉක්බිතිවම සහ බැංකුව විසින් නියම කරන පරිදි ක්‍රමානුකූල කාල අන්තරවල දී මුරපදය වෙනස් කිරීමට ගනුදෙනුකරු මෙයින් එකඟව සිටිනු ලැබේ. එක් එක් මුරපදය බලයලත් පරිශීලකයා විසින් පමණක් දැන සිටින අතර එය කිසිදු ලිඛිත ආකාරයකින් පවත්වා නොගන්නා බවට ද බලයලත් පරිශීලකයා විසින් එහි ආරක්ෂා සහතික කරගැනීම සඳහා සියලු සාධාරණ පියවර ගන්නා බවට ද ගනුදෙනුකරු විසින් සහතික කරගත යුතු ය.

6.5 (ගනුදෙනුවලට අදාළ සියලු දත්ත සහ තොරතුරු ඇතුළුව) Neos BIZ යම් අනවසර තැනැත්තකු/තැනැත්තන් වෙත නිරාවරණය වීමෙන් හෝ එවැනි තැනැත්තකු විසින් Neos BIZ වෙත ප්‍රවේශවීමෙන් හෝ එය භාවිත කිරීමෙන් ආරක්ෂා කරගැනීම සඳහා ගනුදෙනුකරු විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග සකස් කර පවත්වාගෙන යා යුතු ය.

6.6 කිසිවකු හෝ විසින් පරිශීලක අනන්‍යතාවය සහ මුරපදය අනවසරයෙන් භාවිත කිරීමක් හෝ භාවිත කිරීමට තැත් කිරීමක් පිළිබඳව හෝ යම් තුන්වන පාර්ශ්වයක ජීව දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත අනවසරයෙන් ප්‍රවේශවීමක් හෝ එසේ ප්‍රවේශවීමට තැත්කිරීමක් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් වන්නේ නම්, ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

6.7 ජංගම බැංකු සේවා යෙදුමේ පරිශීලක අනන්‍යතාවය (user ID) සහ මුරපදය දැඩි රහස්‍යභාවයකින් යුතුව තබා ගැනීමට/බලයලත් පරිශීලකයන් විසින් තබාගනු ලැබීමට සැලැස්වීමට සහ කිසිදු අවස්ථාවක දී කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ එය හෙළිදරව් නොකිරීමට හෝ කිසිදු තැනැත්තකුට එය පරිශීලනය කිරීමට කිසිදු ඉඩක් නොතැබීමට ගනුදෙනුකරු විසින් මෙයින් භාරගෙන සිටිනු ලැබේ. සියලු අවස්ථාවන්හි දී Neos BIZ හරහා කරනු ලබන සියලු ගනුදෙනුවල දැඩි රහස්‍යභාවය සහතික කිරීමට ද ගනුදෙනුකරු තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

6.8 ජංගම බැංකු සේවා යෙදුම, පරිශීලක අනන්‍යතාවය, මුරපදය, නම් කළ උපකරණය හෝ වෙනත් සත්‍යවත් බව සහතික කිරීමේ කාර්ය පටිපාටියක් අවදානම් සහගත තත්ත්වයකට පත්වී හෝ අවභාවිත කිරීමට ලක් වී ඇති බව හෝ එවැනි තත්ත්වයකට පත් වී හෝ ලක් වී තිබිය හැකි බව, හෝ එහි තොරතුරු අදාළ බලයලත් පරිශීලකයා හෝ බැංකුවේ බලයලත් සේවා නියුක්තයන්ගෙන් එක් අයකු නොවන වෙනත් යම් කිසිවකු හෝ විසින් අත්කරගෙන ඇති බව හෝ අත්කරගෙන තිබිය හැකි බව; යම් උපදෙස් හෝ උපදෙසකට අදාළ යම් මූල්‍ය තොරතුරු හෝ ඒ අනුව කරනු ලැබිය යුතු යම් ගෙවීමක් ලැබීම අකර්මණ්‍ය වීමක් හෝ ලැබීමේ යම් ප්‍රමාදයක් සිදුව ඇති බව; යම් මූල්‍ය තොරතුරු, යම් උපදෙසකට හෝ ගෙවීමකට අදාළ තොරතුරු යැවීමේදී සහ ලබා ගැනීමේදී හෝ ඊට බලපෑමක් කරන යම් දැනුවත්ව සිදු වූ හෝ සැකසහිත වරදක් හෝ වංචාවක් තිබී ඇති බව, හෝ යම් ක්‍රමලේඛන වරදක් හෝ දෝෂයක් හෝ යම් උපදෙසක් දූෂිත වීමක්, හෝ මෙම නියම හා කොන්දේසි වල යම් ආරක්ෂණ විධිවිධාන උල්ලංඝනය වීමක් හෝ ඉදිරියේදී උල්ලංඝනය වීමේ හැකියාවක් තිබී ඇති බව විශ්වාස කිරීමට ගනුදෙනුකරුට යම් හේතු තිබේ නම්, ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව දුරකථනය හරහා බැංකුව වෙත දැනුම් දී පසුව විද්‍යුත් තැපැල් පණිවුඩයක් හෝ ලියාපදිංචි තැපැල හරහා යවනු ලබන ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

6.9 ඉහත 6.8 හි කී සිදුවීම්වලින් යම් සිදුවීමක් සිදුවීමෙන් පසුව, ප්‍රතිකර්මීය පියවර ගැනීමේදී, ගනුදෙනුකරු විසින් බැංකුවේ උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ/ එහි උපරිම උත්සාහය ගත යුතු ය. පරිශීලක අනන්‍යතාවක්, මුරපදයක් සම්බන්ධයෙන් ආරක්ෂාව කඩවීමක් පිළිබඳව දැනුවත් වීමෙන් පසුව වහාම ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවා යෙදුමේ එම පරිශීලක අනන්‍යතාවය, මුරපදය මකා දැමීමට කටයුතු සැලැස්වීම සිදු කළ යුතු අතර නිසි නිවේදනයක් ලැබීමෙන් පසුව, බැංකුව විසින්, එම මුරපදය මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ විය නොහැකි බව සහතික කිරීමට සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය. එවැනි ආරක්ෂාව කඩවීමක් හේතුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් හටගන්නා හේතුවක් මත අහිමි වූ හෝ හිමිකම් පාන්නා වූ යම් මුදලක් සඳහා

ගනුදෙනුකරු වගකිව යුතු වන්නේය.

6.10 මෙහි ආරක්ෂණ විධිවිධාන ඇතුළුව සහ එම විධිවිධාන සම්බන්ධයෙන් සීමා කිරීමකින් තොරව, සියලු බලයලත් පරිශීලකයන් විසින් මෙම නියම හා කොන්දේසි සමාලෝචනය කර, අවබෝධ කරගෙන ඊට අනුකූලව කටයුතු කරන බව ගනුදෙනුකරු විසින් සහතික කරගත යුතුය.

7. ජීවදත්ත භාවිතය

7.1 බලයලත් පරිශීලකයාගේ ජීවදත්ත නම් කළ උපකරණයේ ලියාපදිංචි කරනු ලබන්නේ නම් පමණක් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීම සඳහා ජීවදත්ත භාවිත කිරීමට අවසර දෙනු ලබන බවට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ. ඒ අනුව නම් කළ උපකරණයේ ජීවදත්ත ලියාපදිංචි කර ඇති එකම තැනැත්තා බලයලත් පරිශීලකයා/ පරිශීලකයන් පමණක් වන බව ගනුදෙනුකරු විසින් සහතික කර ගත යුතුය.

7.2 බලයලත් පරිශීලකයාගේ ජංගම උපාංගයේ නම් කළ උපකරණයේ ගබඩා කර ඇති ජීවදත්තමය තොරතුරු ඔහුගේම/ඇයගේම තොරතුරු වන බවටද, යම් තුන්වන පාර්ශවයක ජීවදත්ත බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ නම් කළ උපකරණයේ ගබඩා කර නොමැති බවටද, බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට ඔහුගේම/ඇයගේම ජීවදත්තමය තොරතුරු පමණක් භාවිතා කළ යුතු බවටද ගනුදෙනුකරු විසින් සහතික විය යුතුය. තුන්වන පාර්ශ්වයක ජීවදත්ත නම් කළ උපකරණයේ ගබඩා කිරීම ආශ්‍රිතව ඇතිවන අවදානම් පිළිබඳව සහ ඒ හේතුවෙන් ගනුදෙනුවල සුරක්ෂිතභාවය අවදානමට ලක්විය හැකි වීම පිළිබඳව ගනුදෙනුකරු විසින් තවදුරටත් අවබෝධ කරගෙන පිළිගෙන සිටිනු ලැබේ.

7.3 බලයලත් පරිශීලකයාට සර්වසම වූ සහෝදරයකු හෝ සහෝදරියක සිටින්නේ නම්, සත්‍ය බව සහතික කිරීමේ කාර්ය සඳහා බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් මුහුණ හඳුනාගැනීමේ ක්‍රමය භාවිතා නොකළ යුතු බවටත් එවැනි අවස්ථාවලදී බලයලත් පරිශීලකයා විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීම සඳහා ජීවදත්ත වෙනුවට මුරපදයක් භාවිතා කළ යුතු වන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

7.4 සත්‍ය බව සහතික කිරීමේ කාර්යය සඳහා බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ ජීවදත්තමය තොරතුරු භාවිත කිරීමේ සුරක්ෂිතභාවය අන්‍යාකාරයකින් අවදානමට ලක්විය හැකි වන පරිදි බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ නම් කළ උපකරණ

මගින් සපයනු ලබන යම් විශේෂාංගයක් අක්‍රිය කිරීම සඳහා ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු බවට සහ/හෝ ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් එහි ඇති එවැනි යම් සැකසුම්වලට එකඟ නොවිය යුතු බවට ගනුදෙනුකරු විසින්, එකඟව සිටිනු ලැබේ. (උදා: මුහුණ හඳුනාගැනීම සඳහා වන "attention-aware" යන විශේෂාංගය අක්‍රිය කිරීම)

7.5 බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ මුහුණ/ඇඟිලි සලකුණ හඳුනාගැනීමේ හෝ වෙනත් ආරක්ෂණ ක්ෂේත්‍රයක සුරක්ෂිතභාවයට අවදානමක් ඇතිවී ඇති අවස්ථාවකදී, ගනුදෙනුකරු විසින් හෝ ගනුදෙනුකරු හරහා බලයලත් පරිශීලකයා විසින් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු අතර එවැනි අවස්ථාවක බැංකුව විසින් පරිශීලක අනන්‍යතාවය (User ID) අක්‍රීය කරනු ලැබේ. පරිශීලක අනන්‍යතාවය නැවත සක්‍රීය කර ගැනීමට ගනුදෙනුකරුට අවශ්‍ය වන්නේ නම්, ගනුදෙනුකරු විසින් ආසන්නතම බැංකු ශාඛාව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

7.6 ජීවදත්ත මගින් ප්‍රවේශ වීමේ කාර්යය සඳහා, ජංගම බැංකු සේවා යෙදුම විසින් බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ නම් කළ උපකරණයේ ලියාපදිංචි කර ඇති මුහුණු/ඇඟිලි සලකුණු හඳුනාගැනීම පරිශීලනය කරන බව ගනුදෙනුකරු විසින් පිළිගෙන ඊට එකගව සිටිනු ලබන අතර ජීව දත්ත මගින් ප්‍රවේශ වීමට සැලැස්වීම සඳහා එම තොරතුරු බැංකුව විසින් පරිශීලනය කිරීම සහ භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් සිය කැමැත්ත ලබා දිය යුතුය.

7.7 බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ නම් කළ උපකරණය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගනු ලබන අතර ජීවදත්ත මගින් ප්‍රවේශ වීම සිදුකිරීම සඳහා (ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා විසින් හෝ අන්‍යාකාරයකින් බලය ලබා දී තිබුණ ද) බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් නම් කළ උපකරණය භාවිත කරන සියලු ආකාරයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු වන්නේ ය.

7.8 මෙම නියම හා කොන්දේසි වලට අමතරව සහ එහි වගකීමෙන් මිදීමේ ප්‍රකාශ සහ වගකීමෙන් බැහැර කිරීම් ඉවත් කිරීමෙන් තොරව, නම් කළ උපකරණයේ මුහුණු/ඇඟිලි සලකුණු සත්‍ය බව සහතික කිරීමේ මොඩියුලය බැංකුව විසින් සපයනු නොලබන බවට ද, යම් නම් කළ උපකරණයක මුහුණු/ඇඟිලි සලකුණු සත්‍ය බව සහතික කිරීමේ විශේෂාංගයේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සහ එය උපාංගයේ නිෂ්පාදකයා විසින් ඉදිරිපත් කරන ආකාරයට ක්‍රියා කරන්නේද යන්න සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු පෙනී සිටීමක් හෝ වගකීම දැරීමක් සිදු නොකරන බවටද ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ.

7.9 ජීවදත්ත මගින් ප්‍රවේශ වීම සියලු අවස්ථාවන්හිදී යොදාගත හැකි බවට හෝ ඕනෑම ඉලෙක්ට්‍රොනික උපකරණයක්, මෘදුකාංගයක්, යටිතල පහසුකමක් හෝ බැංකුව විසින් කලින් කලට ලබා දෙන වෙනත් ඉලෙක්ට්‍රොනික බැංකු සේවාවන් සමඟ ක්‍රියාත්මක කළ හැකි බවට බැංකුව විසින් කියා සිටිනු හෝ වගකියනු නොලැබේ.

7.10 අදාළ නීති මගින්, බැංකුව විසින් බැංකුවේ වගකීම බැහැර කිරීම හෝ සීමාකිරීම වළක්වනු ලබන්නේ නම් මිස, ජීවදත්ත මගින් ප්‍රවේශ වීම භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් කිරීම හෝ, ජීවදත්ත මගින් ප්‍රවේශ වීම හරහා හෝ ඒ සම්බන්ධව ගනුදෙනුකරුගේ/බලයලත් පරිශීලකයාගේ උපදෙස් හෝ සිදුවන යම් අනවසර ගනුදෙනු සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් දරනු ලබන යම් පාඩුවක් සඳහා බැංකුව වගකිව යුතු නොවන්නේ ය.

7.11 ජීවදත්ත මගින් ප්‍රවේශවීම අනිසි ලෙස භාවිතය සම්බන්ධයෙන් බැංකුව විසින් දරනු ලබන සියලු පාඩු සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කළ යුතු ය.

8. ගාස්තු සහ ගෙවීම්

Neos BIZ හරහා සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ ගාස්තුවක් සහ බැංකු විසින් තීරණය කරනු ලබන පරිදි Neos BIZ සේවාව භාවිත කිරීමට අදාළව, තිබේ නම්, පහසුකම් සේවා ගාස්තු, නීත්‍යානුකූල ගාස්තු සහ ව්‍යවස්ථාපිත ගාස්තු ඇතුළු වෙනත් වියදම් බැංකුව විසින් නිශ්චය කරනු ලබන සහ බැංකුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ලබන බැංකුවේ අය ක්‍රම උපලේඛනයේ දක්වනු ලබන අනුප්‍රමාණවලින් අය කිරීමට බැංකුවට අයිතිය ඇති බවට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟත්වය පළ කර සිටිනු ලැබේ. ඉහත කී ගාස්තු ගනුදෙනුකරුගේ නම්කළ ප්‍රාථමික ගිණුමෙන් හෝ එහි ප්‍රාථමික ගිණුම වසා දමා, අක්‍රිය කර, ක්‍රියාත්මක කිරීමේ උපදෙස් හේතුවෙන් ගිණුම නොපවතින හෝ ප්‍රමාණවත් මුදල් නොතිබෙන අවස්ථාවකදී, ප්‍රමාණවත් මුදල් පවතින වෙනත් යම් ගිණුමකින් /ගිණුම්වලින් හර කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

9. පුද්ගලික දත්ත

යම් නීතියක් හෝ විධානයක් මගින් නියම කරනු ලබන අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින්, ජංගම බැංකු සේවා යෙදුමට අදාළ හෝ අන්‍යාකාරයක, පුද්ගලික දත්ත කවර හෝ ආකාරයකින් භාවිත කිරීම හෝ ගැලපීම සඳහා සහ බැංකුව හෝ එහි යම් සේවා නියුක්තකයකු විසින් පුද්ගලික දත්ත ජාත්‍යන්තර වශයෙන් පැවරීම සඳහා අදාළ

සියලු බලයලත් පරිශීලකයන්ගෙන්, ආදායකයන්ගෙන්, වෙනත් තුන්වන පාර්ශ්වයන්ගෙන්, රජයේ නියෝජිතායතනවලින් සහ නියාමන අධිකාරීන්ගෙන් ලිඛිත අනුමැතිය සහ අවශ්‍ය වෙනත් සියලු අනුමතයන්, බලපත්‍ර සහ අවසර පත්‍ර ලබා ගත යුතු ය (සහ පවත්වාගෙන යුතු ය). බැංකුවට සාධාරණ ලෙස අවශ්‍ය වන පරිදි එහි ඉල්ලීම මත ගනුදෙනුකරු විසින් එම අනුමැතීන්, අනුමතයන්, බලපත්‍ර සහ අවසරපත්‍රවල මුල් පිටපත්, පිටපත් හෝ වෙනත් සාක්ෂි බැංකුව වෙත ලබාදිය යුතු ය.

10. බලය පැවරීම සහ උපදෙස් ක්‍රියාත්මක කිරීම.

10.1 යම් උපදෙසක් ලැබුණු බව ජංගම බැංකු සේවා යෙදුම මගින් දන්වා යවනු ලබන අවස්ථාවලදී පමණක්, බැංකුව විසින්, එය වෙත උපදෙසක් ලැබී ඇති බව සලකනු ලැබේ. එසේ වුවද, මෙම වගන්තිය, 10.5 වන වගන්තිය යටතේ උපදෙස් ක්‍රියාත්මක නොකිරීම සඳහා වන බැංකුවේ අභිමතයට බලපෑමක් නොවන්නේ ය.

10.2 අදාළ උපදෙස්වල සත්‍යවත් භාවය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් ලෙස, බැංකුව විසින්, මුරපදයක් සහ/හෝ ජීවදත්ත මගින් ප්‍රවේශවීමක් මත බැංකුවට නිශ්චිත වශයෙන්ම විශ්වාසය තැබිය හැකිය.

10.3 ඉහත 10.1 සහ 10.2 වන වගන්තිවල දක්වා ඇති විධිවිධානවලට අගතියක් නොවන පරිදි, බැංකුවට, මෙම නියම හා කොන්දේසි වල විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් ජංගම බැංකු සේවා යෙදුම හරහා බැංකුව වෙත ලැබෙන යම් උපදෙස් හෝ වෙනත් නිවේදනවල සත්‍යවත්භාවය සහ ඒ සඳහා නිසි බලය පැවරීම මත නිශ්චිත වශයෙන්ම විශ්වාසය තැබිය හැකි අතර එම උපදෙස් සහ/හෝ වෙනත් නිවේදන ක්‍රියාත්මක කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත නිසි පරිදි බලය පවරනු ලැබේ.

10.4 මෙම නියම හා කොන්දේසි යටතේ සහ ගනුදෙනුකරු සමග පවතින වෙනත් යම් නියම හා කොන්දේසි යටතේ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී සහ අන්‍යාකාරයකින් එහි වගකීම් ඉටු කිරීමේදී, බැංකුව විසින්, නියෝජිතයන්, අතරමැදියන් සහ වෙනත් තුන්වන පාර්ශ්වයන් යොදාගත හැකි අතර සන්නිවේදන සහ දත්ත හුවමාරු පද්ධති සහ සේවා සැපයුම්කරුවන් තෝරාගෙන යොදාගත හැකි ය. මෙම වගන්තිය යටතේ වන බැංකුවේ අයිතීන්, වෙනත් යම් නියම හා කොන්දේසි යටතේ හෝ අන්‍යාකාරයකින් බැංකුවට තිබිය හැකි වෙනත් යම් අයිතීන්ට අමතරව සහ එම අයිතීන් හීන නොකරන පරිදි පැවතිය යුතු ය.

10.5 සාධාරණ ලෙස කටයුතු කරන්නාවූ බැංකුව විසින් අවශ්‍ය හෝ යෝග්‍ය බවට සලකනු

ලබන අවස්ථාවලදී, බැංකුව විසින්, බලයලත් පරිශීලකයන් වෙත දන්වා, උපදෙස් සියල්ලට හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක නොකිරීම හෝ නැතහොත් ඒ අනුව කටයුතු කිරීම සිදුකරනු ලැබිය හැකි ය.

11. ජංගම බැංකු සේවා යෙදුමේ කාර්ය සාධනය, නඩත්තුව සහ ප්‍රවේශය

11.1 ජංගම බැංකු සේවා යෙදුම දෝෂ රහිත බවට හෝ ඉදිරියේදී එසේ වන බවට, බිඳවැටීම්වලින් තොර බවට, හෝ ගනුදෙනුකරු අපේක්ෂා කරන විශේෂිත කාර්ය හෝ ප්‍රතිඵල සඳහා සුදුසු බවට හෝ ජංගම බැංකු සේවා යෙදුම බාධා රහිතව ක්‍රියා කළ යුතු බවට බැංකුව විසින් සහතික වනු නොලැබේ. හිමිකාරිත්වය, කාර්ය සඳහා යෝග්‍යතාව සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වන සහතික වීම් ඇතුළුව නමුත් සීමා කිරීමකින් තොරව, මෙම නියම හා කොන්දේසි වල විධිවිධාන සලස්වා නොමැති යම් සහතික වීම් ගනුදෙනුකරු විසින් මෙයින් අත්හරිනු ලැබේ.

11.2 (අවශ්‍ය වන්නේ නම්, ජංගම බැංකු සේවා යෙදුමේ හෝ එහි යම් උපාංගවල ක්‍රියාකාරීත්වයට බාධා කිරීම හෝ අත්හිටුවීම ඇතුළුව) ජංගම බැංකු සේවා යෙදුම යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම මගින් එය සාරානුකූලව මෙම නියම හා කොන්දේසි වල අරමුණු කර ඇති කාර්ය සාධන මට්ටම්වලට අනුකූලව ක්‍රියාකරන බව සහතික කිරීම පිණිස, බැංකුව විසින්, එසේ යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම සඳහා සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය. එසේ යාවත්කාලීන කිරීමේ දී සහ නඩත්තු කිරීමේදී ගනුදෙනුකරු විසින් පූර්ණ වශයෙන්ම බැංකුව සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර එසේ යාවත්කාලීන කිරීම හෝ නඩත්තු කිරීම කළ යුතු කාලය බැංකුවේ පරම අභිමතය පරිදි විය යුතු ය.

11.3 ගනුදෙනුකරුගේ වාර්තා පවත්වාගෙන යෑමේ සහ අවශ්‍ය නම්, ප්‍රතිස්ථාපනය කිරීමේ හැකියාව ලබාදීම සඳහා බැංකුව විසින් ගනුදෙනුකරු වෙත සියලු සාධාරණ සහාය ලබා දුන්නද, ජංගම බැංකු සේවා යෙදුම මගින් ඇතුළත් කරන ලද, හෝ සම්ප්‍රේෂණය කරන ලද යම් තොරතුරු හෝ දත්ත සටහන් කර ගැනීම සහ ආරක්ෂක පිටපත් සෑදීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් වගකිව යුතු වේ.

12. වගකීම සහ හානිපූරණය

12.1 ගනුදෙනුකරු විසින්, ගනුදෙනුකරුගේ දැනුවත්භාවය ඇතිව හෝ නොමැතිව, ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් වෙත නිකුත් කර ඇති හෝ ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් ආදේශ කරගෙන ඇති පරිශීලක අනන්‍යතාවයන් සහ මුරපදය භාවිත කිරීම හේතුවෙන් දරන ලද හෝ

පියවන ලද යම් පාඩුවකින් හෝ වගකීමකින් බැංකුව නිදහස් කළ යුතු ය.

12.2 කවර හෝ හේතුවක් මත Neos BIZ මගින් ලබා දී ඇති යම් උපදෙස් පිළි නොගැනීමේ සහ/හෝ පිළිනොපැදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනුකරු විසින් දරන ලද හෝ විඳින ලද යම් පාඩුවක්, හානියක් හෝ වගකීමක් සඳහා බැංකුව ගනුදෙනුකරු වෙත වගකියනු නොලැබිය යුතු ය.

12.3 තුන්වන පාර්ශ්වයන් සමග පවතින විකුණුම් හෝ සේවා සැපයුම් ගිවිසුම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් Neos BIZ හරහා කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, තුන්වන පාර්ශ්වයන් විසින් ඔවුන්ගේ බැඳීම් ඉටු කිරීමේදී ඔවුන්ගෙන් සිදුවන යම් අතපසුවීම්/දෝෂ සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් ගනුදෙනුකරු වෙත වගකියනු නොලැබිය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබිය යුතු ය.

12.4 යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් විසින් කරන ලද යම් ගෙවීම් පසුව එළඹෙන වැඩ කරන දිනය අවසන් වන විට යාවත්කාලීන වන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබිය යුතු අතර සේවා සැපයුම්කරුගේ ප්‍රමාදයන් හේතුවෙන් යාවත්කාලීන කිරීම්වල සිදුවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් බැංකුව ගනුදෙනුකරු වෙත වග කියනු නොලැබිය යුතු ය.

12.5 නම් කළ උපකරණය නැතිවීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් යම් අවස්ථාවක දී හෝ කලින් කලට නඩු පවරනු ලැබිය හැකි, විඳිනු ලැබිය හැකි, දරනු ලැබිය හැකි, කරනු ලැබිය හැකි හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි වන්නා වූ (සියලු නීත්‍යානුකූල සහ වෙනත් පිරිවැය ගාස්තු සහ වියදම් ඇතුළුව) සියලු නඩු, හානි, පාඩු, පිරිවැය, වියදම්, හිමිකම් පෑම්, වගකීම් හෝ ඉල්ලීම් සම්බන්ධයෙන් අවලංගු කළ නොහැකි ලෙස ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු ය.

12.6 Neos BIZ හා සම්බන්ධ බැංකුවේ පද්ධති වලට, බැංකුව වෙත කලින් කලට අදාළ විය හැකි යම් නීති, රීති, නියෝග, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, ආචාරධර්ම සංග්‍රහ සහ පවත්නා වෙළඳපොළ පරිචයන් සැලකිල්ලට ගෙන පද්ධතිය ක්‍රියාකරවීමේදී ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ සැලසුම් සහ පාලනක්‍රම ඇති බව සහතික කිරීම සඳහා බැංකුව විසින් සාධාරණ පියවර ගනු ඇති බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබේ.

12.7 කිසිදු අවස්ථාවකදී, බැංකුව හෝ යම් සේවා සැපයුම්කරුවකු විසින්, ආදායම, ලාභ හෝ ඉතිරිකිරීම්වල යම් අහිමිවීමක් ඇතුළුව එහෙත් ඊට සීමා නොවන යම් ආනුෂාංගික, වක්‍ර, විශේෂ, අනුගාමීව සිදුවන හෝ ආදර්ශ හානි සම්බන්ධයෙන් ගනුදෙනුකරු වෙත වගකිවයුතු නොවන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

12.8 බැංකුවේ බරපතල නොසැලකිල්ල හෝ සිතාමතාම පැහැර හැරීම හේතුවෙන් මිස,:

(i) ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් හෝ බලය පැවරී ඇති හෝ නොමැති වෙනත් යම් තැනැත්තකු විසින් Neos BIZ භාවිතා කිරීම සහ/හෝ එසේ භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරු වෙත ප්‍රවේශ වීම,

(ii) යම් සන්නිවේදන ජාලයක් අකර්මණ්‍ය වීම, තුන්වන පාර්ශ්වයේ යම් සේවා සැපයුම්කරුවන් විසින් කරනු ලබන ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, උපකරණයේ කාර්මික දෝෂයක්, විදුලි බල ඇණ හිටීමක්, ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමක්, බිඳවැටීමක් හෝ අප්‍රමාණවත් බවක්, සවිකිරීම හෝ පහසුකම් හෝ (නීතියේ බලය ඇතිව හෝ නොමැතිව) යම් නීති, රීති, නියෝග, සංග්‍රහ, විධාන, නියාමන මාර්ගෝපදේශ හෝ රජයේ මඟ පෙන්වීම් ඇතුළුව එහෙත් සීමා කිරීමකින් තොරව, බැංකුවේ සාධාරණ පාලනයෙන් තොර වූ යම් ක්‍රියාවන්, නොකර හැරීම හෝ අවස්ථානුගත කරුණු හේතුවෙන්, Neos BIZ සේවාව සැපයීමේ, එම සේවාවට අදාළ උපදෙස් හෝ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ හෝ අන්තර්ජාල අඩවිය (අඩවි) සමග සම්බන්ධවීමේ යම් තොරතුරු; අන්තර් නිරෝධනයක්, අත්හිටුවීමක්, ප්‍රමාදයක්, අහිමිවීමක්, නොපැවතීමත්, විකෘති වීමක් හෝ වෙනත් අපොහොසත් වීමක්, සහ

(iii) ගනුදෙනුකරුට, Neos BIZ භාවිත කිරීමට අදාළව ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/ පරිශීලකයන් විසින් මෙහෙයවනු ලබන සේවාවලට සහ/හෝ ගනුදෙනුවලට හෝ කටයුතුවලට අදාළ යම් තොරතුරු සහ/හෝ ගනුදෙනු යම් සන්නිවේදන ජාල සැපයුම්කරුවකුගේ යම් පද්ධතියක්, උපකරණයක් හෝ සාධන පත්‍රයක් හරහා හෝ එවැන්නක් තුළ සම්ප්‍රේෂණය කිරීම සහ/හෝ ගබඩා කිරීම.

මගින් හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන ප්‍රතිවිපාක සඳහා බැංකුව හෝ එහි යම් සේවා නියුක්තයකු ගනුදෙනුකරු වෙත යම් වගකීමකට හෝ බැඳීමකට යටත් නොවිය යුතු ය.

12.9 ගනුදෙනුකරු/බලයලත් පරිශීලකයා/පරිශීලකයන් හෝ බලය පැවරී ඇති හෝ නොමැති වෙනත් යම් තැනැත්තකු විසින් Neos BIZ වෙත ලියාපදිංචි වීම, ප්‍රවේශ වීම සහ භාවිතා කිරීම සහ/හෝ එකී භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරු හෝ වාර්තා හෝ වෙනත් යම් තොරතුරු පරිශීලනය කිරීම මගින් හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන සියලු ප්‍රතිවිපාක සඳහා ගනුදෙනුකරු පූර්ණ වශයෙන්ම වගකීමට යටත් වන සහ වගකිව යුතු වන බවටද, සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් හෝ සේවා නියුක්තයන් අතරින් යම් අයෙකු විසින් දරනු ලැබිය හැකි කවර හෝ ආකාරයක සියලු වගකීම්, හිමිකම් පෑම්, ඉල්ලීම්, නඩු, හානි, මුදල්, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන් ද, ඒ සම්බන්ධව සේවා සැපයුම්කරුවන් ජ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් අතරින් යම් අයකු විසින් හෝ යම් අයකුට එරෙහිව පවරනු ලැබිය හැකි සියලු නඩු හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් ද ගනුදෙනුකරු විසින් එකී සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් හානිපූරණය කළ යුතු බවටද ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

12.10 3.2 වගන්තියට යටත්ව බැංකුවේ හෝ එහි සේවා නියුක්තයන්ගේ බරපතළ නොසැලකිල්ල හෝ හිතාමතාම පැහැර හැරීම හේතුවෙන් අතපසු වීමෙන් කරන ලද හෝ වැරදි ලෙස යොමු කරන ලද ගෙවීමක ප්‍රතිඵලයක් ලෙස Neos BIZ භාවිතයෙන් සිදු කරන ලද අනවසර ගනුදෙනු හේතුවෙන් සිදුවන මුදල් පාඩුවක් හෝ අස්ථානගත වීමක් සඳහා ගනුදෙනුකරු විසින් වගකියනු නොලැබිය යුතු ය.

12.11 බැංකුවේ හෝ එහි සේවා නියුක්තයන්ගේ පාර්ශ්වයෙන් කිසිදු බරපතල නොසැලකිල්ලක් වංචාවක් හෝ හිතාමතාම පැහැර හැරීමක් සිදුව නොමැති අවස්ථාවක දී, Neos BIZ සේවාව සැපයීම, හෝ ඒ යටතේ සපයන ලද යම් තොරතුරු හෝ වාර්තාවක්/වාර්තා සම්බන්ධයෙන් හෝ මෙම නියම හා කොන්දේසි යටතේ බැංකුවේ බලතල සහ අයිතීන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ආරක්ෂා කිරීමේදී, බැංකුව, එහි සේවා නියුක්තයන් හෝ සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් විසින් දරනු ලැබිය හැකි කවර හෝ ආකාරයක සියලු වගකීම්, හිමිකම් පෑම්, පාඩු, හානි, මුදල්, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන්ද ඔවුන්ගෙන් යම් අයකු විසින් හෝ යම් අයකුට එරෙහිව පවරනු ලබන සියලු නඩු හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් ද ගනුදෙනුකරු විසින් එකී බැංකුව, එහි සේවා නියුක්තයන් හෝ සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් හානිපූරණය කළ යුතු ය.

12.12 යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් තුළ, එනම්, උදාහරණයක් ලෙස පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයන්, සමාජ ජාලා ආදියෙහි භාවිත කරනු ලබන පොදු පරිශීලක අනන්‍යතාවයන් සහ මුරපද යොදා ගනිමින් Neos BIZ භාවිත කිරීම හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගනුදෙනුකරු පූර්ණ වශයෙන්ම දැනුවත්ව සිටින බවටත් එවැනි අවස්ථාවන් වැළැක්වීම සඳහා නිසි පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග ගනු ලබන බවටත් යම් පරිශීලක අනන්‍යතා/මුරපද සොරකම් සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොකරන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව, පිළිගනු ලැබේ.

12.13 මෙම නියම හා කොන්දේසි මගින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තාක්දුරට හැර, ජංගම බැංකු සේවා යෙදුමට අදාළව, ඍජුව හෝ වක්‍රව, ගනුදෙනුකරු, බලයලත් පරිශීලකයන් හෝ කවර හෝ ආකාරයකින් Neos BIZ භාවිතා කරන ගනුදෙනුකරුගෙන් නිලධරයන්, සේවා නියුක්තයන් හෝ නියෝජිතයන් හේතුවෙන් ඇති වන කවර හෝ ආකාරයක යම් පාඩුවක් සඳහා හෝ සම්බන්ධයෙන් සහ දත්ත ඉලෙක්ට්‍රොනිකව සම්ප්‍රේෂණය කිරීමේදී සිදුවන යම් දත්ත නැතිවීමක් සහ/හෝ වැරදි ලෙස යොමු කිරීමක් සම්බන්ධයෙන් සහ ලිඛිත ඉල්ලීමක් මත බැංකුව විසින් ගනුදෙනුකරු බලයලත් පරිශීලකයන් වෙත නිකුත් කරනු ලබන මුල් මුරපදය/ මුරපද සහ/හෝ පසුව නිකුත් කරනු ලබන මුරපද උත්පාදනය කිරීම සහ නිකුත්කිරීම යන හේතු සඳහා, (නොසැලකිලිමත් බව හෝ අන්‍යාකාරයක් සඳහා ගිවිසුම්ගතව හෝ සිවිල් වරදක් සිදුකර ඇත්තේ වුවද) බැංකුව වගකියනු නොලැබිය යුතු බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබේ.

13. අවසන් කිරීම

නියම හා කොන්දේසිවල කවරක් අන්තර්ගතව වුව ද,

13.1 Neos BIZ භාවිතය අවසන් කිරීමට ගනුදෙනුකරු විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ගනුදෙනුකරු විසින්, එම තීරණය බැංකුව වෙත දැනුම් දී ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක් ආසන්නතම බැංකු ශාඛාව වෙත භාරදිය යුතුය.

13.2 බැංකුව විසින් ගනුදෙනුකරු වෙත පූර්ව දැන්වීමක් ලබා දී ස්වකීය පරම අභිමතය පරිදි Neos BIZ අවලංගු කිරීම, ඉවත් කිරීම අලුත් කිරීම සිදුකළ යුතු ය.

13.3 පහත දැක්වෙන අවස්ථාවන්හි දී, විද්‍යුත් තැපැල හරහා යවනු ලබන පූර්ව දැන්වීමක්

මගින්, ගනුදෙනුකරුගේ/බලයලත් පරිශීලකයාගේ/පරිශීලකයන්ගේ පරිශීලක අනන්‍යතාවය අක්‍රීය කර Neos BIZ වෙතින් ගනුදෙනුකරුගේ ප්‍රොෆයිලය මකා දැමීමට බැංකුව වෙත අයිතිය ඇති බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ;

(i) බැංකුව විසින් තීරණය කරනු ලබන අඛණ්ඩ කාලසීමාවක් සඳහා පහසුකම් සේවා ගාස්තු ගෙවා නොමැති/පහසුකම් සේවා ගාස්තු ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් මුදල් ගිණුම්වල නොමැති අවස්ථාවක දී,

(ii) බැංකුව හෝ ගනුදෙනුකරු විසින්, මෙම නියම හා කොන්දේසි යටතේ එහි බැඳීම් ඉටු කිරීම හෝ ඊට අනුකූලව කටයුතු කිරීම, කවර හෝ ස්ථානයක යම් අධිකරණ බලයක් යටතේ වන (නීතියේ බලය ඇතිව හෝ නොමැතිව වුව ද, නමුත්, නීතියේ බලය නොමැති වන්නේ නම්, විධානයේ අනුකූලතාව, විධානය අදාල වන්නේ කවර තැනැත්තන්ගේ හෝ අස්තිත්වයන් සඳහා ද එම තැනැත්තන් හෝ අස්තිත්වයන්ගේ සාමාන්‍ය පරිචයට අනුව තිබෙන්නේ නම් පමණක්) යම් අදාළ නීතියකට, විධානයකට, නියෝගයකට, ඉල්ලීමකට, නියමයකට, රීතියකට, ප්‍රතිබාධන වැඩසටහනකට, ප්‍රතිපත්තියකට, මාර්ගෝපදේශයකට හෝ යම් නියෝජ්‍යත්ව, යම් රාජ්‍ය හෝ යම් ස්වයං නියාමන සංවිධානයක දැන්වීමකට පටහැනි වන අවස්ථාවක දී;

(iii) සියලු ගිණුම් වසා දැමීමෙන් පසුව.

14. සංශෝධන

14.1 මෙම නියම හා කොන්දේසි වලින් කිසිවක්, ගනුදෙනුකරුට දැන්වීමක් ලබාදී ස්වකීය පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමට, ඒවාට යමක් එකතු කිරීමට හෝ වෙනස් කිරීමට බැංකුව හිමිකම් ලැබිය යුතු අතර එම සංශෝධනය, එකතු කිරීම හෝ වෙනස් කිරීම මගින් ගනුදෙනුකරු බැඳී සිටිය යුතු වේ. නියම හා කොන්දේසි වල යාවත්කාලීන කරන ලද අනුවාදය බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි විය යුතුය.

14.2 Neos BIZ භාවිත කිරීම සමග සම්බන්ධිත වරප්‍රසාද බැංකුව විසින් නිශ්චය කළ යුතු අතර, කලින් කලට බැංකුව විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරිදි, ගනුදෙනුකරු වෙත සුදුසු දැන්වීමක් ලබා දී, ඒ සමග සම්බන්ධිත මෙම වරප්‍රසාද සහ කොන්දේසි වෙනස් කිරීමට, මද වශයෙන් වෙනස් කිරීමට, ඒවාට යමක් එකතු

කිරීමට හෝ සංශෝධනය කිරීමට බැංකුවට පරම අභිමතය තිබිය යුතුය.

14.3 Neos BIZ භාවිත කිරීම, බැංකුවේ පවත්නා ව්‍යවස්ථා, කොන්දේසි, රීති, නියෝග සහ Neos BIZ මගින් ආවරණය කරනු ලබන අන්‍යාකාරයක සියලු සේවා, පහසුකම් සහ ගනුදෙනු පාලනය කරන්නා වූ යම් නියම හා කොන්දේසි වලට යටත් විය යුතු ය.

15. විවිධ

15. 1 උල්ලංඝනය කිරීම් පිළිබඳ දැන්වීම සහ බුද්ධිමය දේපළ කඩකිරීම; ගනුදෙනුකරු හෝ බලයලත් පරිශීලකයකු හෝ තුන්වන පාර්ශ්වයක් විසින් මෙම නියම හා කොන්දේසි උල්ලංඝනය කිරීමක් පිළිබඳව හෝ මෙම නියම හා කොන්දේසිවල සඳහන් කර ඇති බැංකුවේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් කඩකිරීමක් පිළිබඳව හෝ ජංගම බැංකු සේවා යෙදුම මගින් යම් තුන්වන පාර්ශ්වයක අයිතීන් කඩ වන බවට වන චෝදනාවක් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් වන්නේ නම් හෝ එසේ සැක කිරීමට හේතු තිබෙන්නේ නම්, ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

15.2 ශීර්ෂයන් යොමුව සඳහා පමණි:

මෙම නියම හා කොන්දේසිවල ශීර්ෂයන් යොදා ඇත්තේ යොමු කිරීමේ පහසුව සඳහා පමණක්ම වන අතර ඒවා කිසිදු ආකාරයකින් මෙම නියම හා කොන්දේසි වල අර්ථ දැක්වීමට හෝ පද සම්බන්ධයට බලපෑමක් නොකළ යුතු ය.

15.3 දැන්වීම්:

ගනුදෙනුකරු විසින් හෝ බැංකුව විසින් මෙම නියම හා කොන්දේසි වලට අදාළව ලබා දිය යුතු වන යම් දැන්වීමක් බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු අතර අයකිරීම්/ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන බැංකුවේ අයක්‍රම උපලේඛනයේ යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

16. විමසීම් සහ පැමිණිලි

16.1 Neos BIZ භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුට යම් පැමිණිල්ලක් හෝ

විමසීමක් කිරීමට ඇති අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් 0094 112 448888 යන අංකයෙන් බැංකුවේ පැය 24ම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම හෝ බැංකුවේ ශාඛාවක් වෙත ප්‍රවේශ වීම සිදුකළ යුතු ය. පැමිණිල්ල නිරාකරණය නොවූයේ නම්, ගනුදෙනුකරු විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හෝ ශ්‍රී ලංකා මහබැංකුව මගින් පිළිසරණ ඉල්ලා සිටිය හැකි ය.

16.2 ගනුදෙනුකරුට දැන ගැනීමට ලැබුණු ගනුදෙනුවල සිදුවූ යම් දෝෂයක්, විෂමතාවක් හෝ නොකර හැරීමක් පිළිබඳව ගනුදෙනුකරු විසින් ප්‍රකාශයේ දින සිට දින 14 ක් ඇතුළත බැංකුව වෙත දැනුම් දිය යුතුය.

17. පාලනය වන්නා වූ නීතිය සහ අධිකරණ බලය

17.1 මෙම නියම හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය විය යුතු අතර එම නීති ප්‍රකාරව අවබෝධ කරගනු ලැබිය යුතු ය. මෙම නියම හා කොන්දේසි හෝ ඒවායෙහි යම් සංශෝධනයක් හෝ ඒවාට යමක් එකතු කිරීමක් ඇතුළත්වන ගිවිසුම තුළින් හෝ ඒ සම්බන්ධයෙන් හටගන්නා යම් ආරවුලක් එම කාර්ය සඳහා වන ශ්‍රී ලංකා අධිකරණවල අනන්‍ය අධිකරණ බලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

17.2 ගනුදෙනුකරු විසින් ඉහත වගන්ති කියවා අවබෝධ කරගෙන ඇති බවටත් Neos BIZ සේවාව භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගෙවීමට සිදුවන්නා වූ ගාස්තු ඇතුළුව ඉහත නියම හා කොන්දේසි මගින් බැඳීමට එකඟ වන බවටත් ගනුදෙනුකරු මෙයින් ස්ථිර කොට එකඟව සිටිනු ලැබේ.

17.3 බැංකුව විසින්, අදාළ නීති සහ නියෝග ප්‍රකාරව යම් සැක කටයුතු සහ නියම කරන ලද සීමාවෙන් ඉහළ ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවේ පවත්නා යම් නීති හෝ නියෝගවලට අනුකූලව බැංකුව විසින් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක් සඳහා බැංකුව වගකියනු නොලැබිය යුතුය. කෙසේ වුව ද, අවසරලත් සීමාවට ඉහළ ඕනෑම ගනුදෙනුවක් බැංකුව විසින් ස්වයංක්‍රීයව අවහිර කරනු ලැබිය යුතු ය.

17.4 බැංකුවේ මූලික කාරණා අන්තර්ගත ලේඛන සහ නියම හා කොන්දේසි ආයතනික වෙබ් අඩවියෙන් ලබාගත හැකි විය යුතු ය.

18. පැවරීම

18.1 බැංකුවට මෙම යෙදුම යටතේ එහි අයිතීන්, ප්‍රතිලාභ සහ/හෝ බැඳීම් සියල්ලට

හෝ ඉන් කොටසක් ලියා දැක්වීමට, පැවරීමට හෝ මාරු කිරීමට අයිතියක් ඇති බවටත්, එම පැවරීම මගින් ගනුදෙනුකරු බැඳී සිටිය යුතු බවටත්, ඒ බව බැංකුව විසින් ගනුදෙනුකරු වෙත දැන්විය යුතු බවටත්, එම ලියා දැක්වීම, පැවරීම හෝ මාරුකිරීම හේතුවෙන් ගනුදෙනුකරුගේ අයිතීන් අඩුවන අවස්ථාවක දී, බැංකුව විසින් ගනුදෙනුකරුගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු බවටත් ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

18.2 මෙම නියම හා කොන්දේසි යටතේ වන බැංකුවේ බැඳීම් සේවා මට්ටම් ප්‍රමිතීන් ද සමග බැංකුවේ පාලිත සමාගම්, අනුබද්ධ සමාගම් හෝ කොන්ත්‍රාත් සමාගම් වෙත පවරනු ලබන හෝ එවැනි සමාගමක් විසින් සපුරාලනු ලබන අවස්ථාවක දී හැර, එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශවයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව මෙම නියම හා කොන්දේසි යටතේ වන එහි අයිතීන් හෝ බැඳීම් පැවරීම හෝ මාරු කිරීම සිදුකළ නොහැකි ය.

18.3 නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය සමග අපගේ සම්බන්ධතාවය අප විසින් කියවා, පැහැදිලි කරනු ලැබ අවබෝධ කරගෙන ඇති නියම හා කොන්දේසි වලට යටත් වන බවට අප විසින් එකඟව සිටිනු ලැබේ. අස්තිත්වයේ හවුල්කරුවන්ගේ/අර්ථදායී අයිතිකරුවන්ගේ යම් වෙනස්වීමක් සිදුවේ නම් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත ලිඛිතව දැනුම් දීමට ද අප විසින් බාර ගෙන සිටිනු ලැබේ.

19. ගනුදෙනුකරුගේ ප්‍රකාශය

19.1 (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය විසින් අප වෙත Neos BIZ පහසුකම ලබාදීමට එකඟ වීම සැලකිල්ලට ගනිමින්, මෙම නියම හා කොන්දේසි අප විසින් අවබෝධ කරගෙන පිළිගන්නා ලද බවට මෙයින් එකඟව සිටිනු ලබන අතර Neos BIZ පහසුකම පාලනය වන්නා වූ බැංකුවේ සියලු නියම හා කොන්දේසි වලින් බැඳී සිටීමට අප විසින් එකඟව සිටිනු ලැබේ. බැංකුව අපගේ ඉල්ලීමට එකඟවීම සම්බන්ධයෙන් අප විසින් බැංකුවට එරෙහිව කිසිදු විරෝධතාවක් නොනගන බවට අප ප්‍රකාශ කර සිටින්නෙමු. ජංගම බැංකු සේවා යෙදුම/ Neos BIZ හි රහස්‍යභාවයට සහ/හෝ සුරක්ෂිතභාවයට බලපාන යම් බාහිර සාධක සම්බන්ධයෙන් බැංකු වගකීමක් නොදරන බවට අප විසින් එකඟව සිට පිළිගනු ලැබේ. තවද, බැංකුව විසින් එසේ අපගේ ඉල්ලීම පිළිගැනීම සම්බන්ධයෙන් වන හෝ එසේ කිරීමෙන් හටගන්නා සියලු නඩුකර, නඩු කටයුතු, වගකීම්, හිමිකම්පෑම්,

හඩු, හානි, පිරිවැය සහ වියදම්වලට එරෙහිව බැංකුව හානිපූරණය කර තැබීමට අප විසින් එකඟව සිටිනු ලැබේ. ජංගම බැංකු සේවා යෙදුම/ Neos BIZ අවදානම ලක්ව ඇති බව හෝ අවභාවිත කරනු ලැබ ඇති බව අප විශ්වාස කරන්නේ නම්, දුරකථන ඇමතුමක් මගින් වහාම බැංකුව වෙත ඒ බව දන්වා පසුව විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් සහ/හෝ ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් බැංකුව වෙත දන්වනු ලබන බවට අප සහතික කර සිටින්නෙමු. මෙම නියම හා කොන්දේසි වල ආරක්ෂණ විධිවිධාන ඇතුළුව සහ ඒ සඳහා සීමා කිරීමකින් තොරව මෙම නියම හා කොන්දේසි සියලු බලයලත් පරිශීලකයන් විසින් අවබෝධ කරගෙන ඒවාට අනුකූලව කටයුතු කරන බවට අප විසින් තවදුරටත් ප්‍රකාශ කර එකඟව සිටිනු ලැබේ.

19.2 පහත දැක්වෙන විමසීම් සියල්ලටම හෝ ඉන් කිසිවකට බැංකුව විසින් තීරණය කරන පරිදි ප්‍රතිචාර දැක්වීමට සහ සැලසීමට මා විසින් බැංකුව වෙත බලය පවරනු ලැබේ;

19.2.1 ගිණුම (ගිණුම්), සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමට නීත්‍යානුකූලව අවසර ඇති වෙනත් යම් බැංකුවලින්, ණය තොරතුරු කාර්යාංශයෙන් (CRIB) හෝ වෙනත් යම් අධිකාරියකින් ලැබෙන විමසීම් සියල්ල සහ ඉන් කිසිවක් සම්බන්ධයෙන්, මාගෙන් විමසීමෙන් තොරව ප්‍රතිචාර දැක්වීමට සහ සැලසීමට. සැක දුරු කිරීම සඳහා එවැනි ප්‍රතිචාරයකට බැංකු යොමුවක් ඇතුළත් කළ හැකි ය.

19.2.2 එවැනි අනාවරණය කිරීමක් කරන ලෙසට නීතියෙන් හෝ අධිකරණය විසින් බැංකුවට නියම කර ඇත්තේ හෝ බලය පවරා ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, එම තැනැත්තාගෙන් ලැබෙන විමසීම්.

19.2.3 බැංකුව වෙත රහස්‍යභාවය ආරක්ෂා කිරීම පිළිබඳ රාජකාරියකින් යටත්ව සිටින යම් තැනැත්තකුගෙන් ලැබෙන විමසීම්.

19.2.4 අපගේ ගිණුම (ගිණුම්)/පහසුකම්වලට අදාළව පවතින බැංකුවේ යම් අයිතීන් හෝ බැඳීම් සම්බන්ධයෙන් වන යම් සැබෑ හෝ ඉදිරියේ දී සිටිය හැකි පැවරුම්ලාභියෙකු, සහභාගිවන්නකු හෝ ගිවිසුම්ගත පාර්ශ්වයක් වෙතින් ලැබෙන විමසීම්.

19.3 ඉහත නියම හා කොන්දේසි පැහැදිලි කරගෙන, කියවා අවබෝධ කර ගනු ලැබූ බවට අප මෙයින් ස්ථිර කොට එකඟව සිටිනු ලබන අතර Neos BIZ පහසුකම

භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස කරනු ලබන අයකිරීම් ඇතුළුව ඉහත නියම හා කොන්දේසි මගින් බැඳීමට එකඟව සිටිනු ලැබේ.

(සාංගමික ව්‍යවස්ථාවලිය අනුව)

....	....
නම	නම
....	....
තනතුර	තනතුර
....	....
සමාගමේ නිල මුද්‍රාව (තිබේ නම්)	සමාගමේ නිල මුද්‍රාව (තිබේ නම්)
....	....
දිනය	දිනය
....	....
සාක්ෂි දරනු ලැබුවේ	නම සහ ජාතික හැඳුනුම්පත් අංකය
....	
දිනය	